**ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රස්ථානය සමඟ එක්වීමට ඔබටත් අනගි අවස්ථාවක්**



# ශ්‍රී ලංකා මහ බැංකුව

උද්‍යෝගිමත් සහ කණ්ඩායම් හැඟීමෙන් වැඩ කිරීමේ හැකියාව ඇති තරුණ තරුණියන්හට

# බැංකු සහායකයින් (පුහුණු)

වශයෙන් එක්වන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ආරාධනා කරයි.
පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්හට ඉහත තනතුර සඳහා අයදුම් කළ හැකිය.

## 1. සුදුසුකම් නිර්ණායක

**1.1 අවශ්‍ය අධ්‍යාපනික සුදුසුකම්:**

(අ). අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් ගණිතය සහ ප්‍රධාන භාෂාව (සිංහල හෝ දෙමළ) ඇතුළු ව, අවම වශයෙන් විෂයයන් පහක් (05) සඳහා "බී" (B) සාමර්ථ්‍යයන් ද ඉංග්‍රීසි භාෂාව සඳහා "සී" (C) සාමර්ථ්‍යයක් ද සහිතව අ.පො.ස. (සා.පෙ.) විභාගය එක් වරක දී විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

සහ

(ආ). අ.පො.ස. (උ.පෙ.) විභාගය ඕනෑම විෂය ධාරාවක් යටතේ ප්‍රධාන විෂයයන් සඳහා (සාමාන්‍ය ඉංග්‍රීසි හැර) එක් වරක දී අවම වශයෙන් "බී" (B) සාමර්ථ්‍යයන් තුනක් සමත්ව තිබීම.

**1.2 වයස:** 2025.05.23 දිනට වයස අවු. 18 ට නොඅඩු සහ අවු. 22 ට නොවැඩි විය යුතු ය. ඒ අනුව 2003.05.24 සිට 2007.05.23 අතර කාලය තුළ (එම දින දෙක ද ඇතුළුව) උපන්දිනය ඇති අයදුම්කරුවන් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

## 2. තෝරා ගැනීමේ පටිපාටිය

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන තරග විභාගයකින් අනතුරුව පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් මගින් තෝරාගනු ලබයි. තරග විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

(i) සාමාන්‍ය බුද්ධිය (ලකුණු 100) - පැය 01

(ii) සංඛ්‍යාත්මක කුසලතා (ලකුණු 100) - පැය 01

(iii) අවබෝධය (ලකුණු 100) - පැය 01

තරග විභාගය සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍යවලින් පවත්වනු ලැබේ. මාර්ගගත අයදුම්පතේ (online application form) තෝරාගත් භාෂා මාධ්‍යය කිසිදු හේතුවක් මත පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

## 3. අයදුම් කිරීම

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ www.doenets.lk, "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාරගැනීම 2025.04.23 දින පෙ.ව. 09.00 සිට 2025.05.23 දින ප.ව. 09.00 දක්වා විවෘතව පවතියි. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කරගත යුතු අතර අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපැදිය යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සටහන:**

අයදුම්පත් ඉදිරිපත් කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීම නිසා ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් දරාගත යුතු ය.

### 3.1 විභාග මධ්‍යස්ථාන:

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් මාර්ගගත අයදුම්පතේ සඳහන් කර ඇති විභාග මධ්‍යස්ථානවල දී තරග විභාගය පවත්වනු ලැබේ. තම මනාපය අනුව තෝරා ගන්නා ලද විභාග මධ්‍යස්ථාන කිසිදු හේතුවක් මත පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

(i) ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

(iii) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොර ව විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳ නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොර ව සිටිය යුතු ය.

### 3.2 විභාග ගාස්තු:

විභාග ගාස්තුව රු.600/- කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

(i) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)

(ii) අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)

(iii) ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් (Online Banking Method of Bank of Ceylon)

(iv) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

**සටහන:**

(අ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් නිල වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර, විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හෝ ශ්‍රී ලංකා මහ බැංකුව වගකියනු නොලැබේ.

(ඇ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

### 3.3 ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම

- පුවත්පත් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත පුවත්පත් නිවේදනයේ සඳහන් වයස් සීමාවට ඇතුළත් වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත් නිවැරදිව මාර්ගගතව යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් මාර්ගගතව පමණක් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.
- තරග විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහා ම ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලබන නිවේදනය මගින් හා අයදුම්කරු පද්ධතියට ප්‍රවේශ වීමට භාවිතා කළ ජංගම දුරකතන අංකයට කෙටි පණිවිඩයක් මගින් දැනුම් දෙනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම්, එම නිවේදනයේ සඳහන් ආකාරයට විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් ඒ පිළිබඳව විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදිව සඳහන් කළ යුතු ය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු වේ නම් එම විස්තර සමග ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක්, ප්‍රවේශ පත්‍ර නිකුත් කළ බව සඳහන් කරමින් පළ කරන නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය වෙත වහාම යොමු කළ යුතු ය.
- අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

### 3.4 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම

විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

## 4. තනතුරට අදාළ නියමයන් හා කොන්දේසි

- පුහුණු කාලය වසර දෙකක් (02) වන අතර, එම කාලය තුළ සියලු දීමනා ඇතුළත් ව මසකට රු. 65,000.00 ක ස්ථාවර දීමනාවක් ගෙවනු ලැබේ.
- බැංකු සහායකයින් (පුහුණු) වසර දෙකක සාර්ථක පුහුණු කාල සීමාවකින් පසුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථිර සේවයේ කළමනාකාර සහකාර පන්තියේ I (1) ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලබන අතර, ඉන්පසු වසරක පරිවාස කාලයක් සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව, ආශ්‍රිත කළමනාකාර සහකරුවන් (Associate Management Assistants) ලෙස, එම ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කළ දින සිට ස්ථිර කිරීමට සලකා බලනු ලැබේ.
- කළමනාකාර සහකාර පන්තියේ I (1) ශ්‍රේණියේ නිලධාරීන් ආකර්ෂණීය වැටුපක් සමඟ වාර්ෂික විශේෂ දීමනාවක්, අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ප්‍රතිලාභ, වෛද්‍ය ප්‍රතිලාභ, සේවක ණය පහසුකම්, විශ්‍රාම වැටුප් සමඟ පුහුණු අවස්ථා සඳහා හිමිකම් ලබනු ඇත.
- බඳවාගත් අපේක්ෂකයින් කළමනාකාරීත්වයේ උපදෙස් පරිදි දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ යුතු වේ.

## 5. වෙනත් කොන්දේසි

- අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සපුරා නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර, අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සහතික පත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අවස්ථාවල කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා පත් කර ගනු නොලැබේ.
- මෙම තනතුරට තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.
- බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීමේ සහ බඳවා ගැනීම කල් දැමීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය.
- සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතු ය.

**අධ්‍යක්ෂ - මානව සම්පත්**
ශ්‍රී ලංකා මහ බැංකුව, අංක. 30, ජනාධිපති මාවත, කොළඹ 01.
දුරකථන : 011-2477330 ෆැක්ස් : 011-2477715